# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2457/07 - 2025 ඔක්තෝබර් මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2025.10.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: ටීඑච්අයි/එල්එන්ඩී/එල්2/ජ්සීකිවුවීඅයි/163.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :-*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 335සී කපුදූව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කපුදූව නැගෙනහිර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ක.සි. 820131 හා 2024.10.16 දිනැති සැලැස්මේ කැබලි අංක 1 සහ 2 ලෙස පෙන්නුම් කර ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0050 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස්:

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: කපුදූව වලව්වත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0011.

02. **කැබලි අංක 2**
ඉඩමේ නම: කපුදූව වලව්වත්ත; ඉඩමේ විස්තරය: මාර්ගය (ප්‍රාදේශීය සභා); හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0039.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2025 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ. ව. 10.00 ට තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 ඔක්තෝබර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඇති ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**ඩී. එච්. යූ. සඳමාලි,**
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
තිහගොඩ.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0082